රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි: 01/2014

මගේ අංකය :- EST-2/POLCY/03/0798-I
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2014.03.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එහි 05 ඡේදයේ සඳහන් පරිදි, ඇමුණුම 01හි ඇතුළත් නොවූ, ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් තනතුරු දරන නිලධරයන් විසින් ලබා ගත යුතු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම (සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව) තීරණය කළ යුතු වේ. එබැවින් මේ සමඟ අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කර අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ද සහිතව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014හි 13 ඡේදයේ සඳහන් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීමට ක්‍රියා කරන මෙන් දන්වා සිටිමි.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

(මෙම ආකෘතිය පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කරන්න)

මගේ අංකය :-
ඔබේ අංකය :-
............................................
............................................
............................................
............................................

2014.

ආයතන අධ්‍යක්ෂ ජනරාල්

<u>**රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**</u>

2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව මෙම අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතේ ඇති පහත සඳහන් තනතුරු සඳහා අදාල විය යුතු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම තීරණය කර මා වෙත දැනුම් දෙන මෙන් ඉල්ලමි.

| අනු අංකය<br>1 | තනතුරු නාමය<br>2 | බඳවා ගැනීමේ පරිපාටියේ/ සේවා ව්‍යවස්ථාවේ යොමු අංකය<br>3 | දෙපාර්තමේන්තු ප්‍රධානියා/ අමාත්‍යාංශ ලේකම් නිර්දේශ කරන ප්‍රවීණතා මට්ටම<br>4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන ප්‍රවීණතා මට්ටම<br>5 |
|---|---|---|---|---|
| | | | | |

............................................................
අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

---

මගේ අංකය :-
ඔබේ අංකය :-

2014.

............................................
............................................

<u>**රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**</u>

ඔබේ සමාංක හා .......................... දිනැති ලිපිය හා සම්බන්ධ වේ.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 යටතේ එහි සඳහන් තනතුරු සඳහා අදාළ විය යුතු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම ඉහත උප ලේඛනයේ 5 වන තීරුවේ සඳහන් පරිදි විය යුතු බව දන්වනු කැමැත්තෙමි.

ආයතන අධ්‍යක්ෂ ජනරාල්